චක්‍රලේඛ අංක 2015/02

මගේ අංකය:- එෆ්ජ්/211/2015
මැතිවරණ මහලේකම් කාර්යාලය
සරණ මාවත,
රාජගිරිය.

2015.08.21

සියළුම අමාත්‍යාංශ ලේකම්වරු, පළාත් සභා ප්‍රධාන ලේකම්වරු හා ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති,
රාජ්‍ය සේවා කොම්පත් සභාවේ ලේකම් හා සෙසු ව්‍යවස්ථාපිත කොම්පත් සභා ලේකම්වරු,
සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීහු හා පළාත් සභා අමාත්‍යාංශ ලේකම්වරු,
පළාත් ආණ්ඩුකාරවර ලේකම්වරු හා පළාත් රාජ්‍ය සේවා කොම්පත් සභා ලේකම්වරු,
සියළුම සංස්ථා හා ව්‍යාවස්ථාපිත මණ්ඩලවල සභාපතිවරු/ සාමාන්‍යාධිකාරීවරු,

**පාර්ලිමේන්තු මැතිවරණය - 2015.08.17**

**<u>මැතිවරණ කාර්ය මණ්ඩලයට ගෙවීම්</u>**

2015.08.17 දින පැවැත්වූ පාර්ලිමේන්තු මැතිවරණයේදී මාගේ හෝ දිස්ත්‍රික් තේරීම්භාර නිලධරයාගේ උපදෙස් අනුව මැතිවරණ රාජකාරිවල නිරත වූ කාර්ය මණ්ඩලයට ගෙවිය හැකි ගාස්තු ප්‍රමාණ හා එම ගෙවීම්වලට අදාල ගිණුම් කාර්ය පරිපාටිය පහත සඳහන් කර ඇත.

02. මැතිවරණ රාජකාරි සඳහා ගෙවීම් කිරීමට පෙර මෙම චක්‍රලේඛයේ ඇතුලත් කරුණු මැනවින් අධ්‍යයනය කර ගෙවීම් කරන ලෙස ඔබගේ ගිණුම් කාර්ය මණ්ඩලයට උපදෙස් දිය යුතුය. මෙම චක්‍රලේඛයේ සඳහන් උපදෙස්වලින් පරිබාහිරව සිදු කරනු ලබන ගෙවීම් ප්‍රතිපූර්ණය නො කරන අතර එවැනි ගෙවීම් සම්බන්ධයෙන් සම්පූර්ණ වගකීම ගෙවීම් කරන නිලධරයා විසින් භාර ගත යුතුය.

03. මැතිවරණ කාර්ය මණ්ඩලයට ගෙවීම් කළයුතු ස්ථාන හා එම ස්ථානවලින් සිදු කළයුතු ගෙවීම් පහත පරිදි කාණ්ඩ දෙකකට වර්ගීකරණය කර ඇත. ගෙවීම් කරන නිලධරයා විසින් එම ස්ථාන හා ගෙවීම් පැහැදිලිව හඳුනාගෙන, ඒ අනුව ගෙවීම් සිදු කළයුතුය.

අ) තම ස්ථිර සේවා ස්ථානයෙන් කරනු ලබන ගෙවීම්

දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන්ගේ උපදෙස් මත පහත සඳහන් කාර්යයන්හි නිරත වූ රජයේ කාර්යාල/ආයතනවල ස්ථිර කාර්ය මණ්ඩලයට හා අනියුක්ත සහායකයන්ට පහත දක්වා ඇති උපදෙස්වලට අනුව තම ස්ථිර සේවා ස්ථානයෙන් ගමන් වියදම් හා දීමනා ගෙවිය හැකිය. එම ගෙවීම් පිළිබඳ විස්තර මෙම චක්‍රලේඛයේ 10.1 හා 10.2 අනුජේදවල සඳහන් උපලේඛන සමඟ ඉහත ලිපිනයට ඉදිරිපත් කළ පසු එම මුදල් මවිසින් ප්‍රතිපූර්ණය කරනු ලැබේ.

I. කලාපභාර සහකාර තේරීම්භාර නිලධරයකු වශයෙන් හෝ ඡන්ද ප්‍රදේශ/ ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් පිහිටුවනු ලැබූ සම්බන්ධීකරණ කාර්යාලයක සහකාර තේරීම්භාර නිලධරයකු වශයෙන් කටයුතු කිරීම.

II. ඡන්ද පොළක හෝ ඡන්ද ප්‍රදේශ/ ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් පිහිටුවනු ලැබූ සම්බන්ධීකරණ කාර්යාලයක ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපති/ අතිරේක ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපති/ කණිෂ්ඨ ඡන්ද ස්ථානාධිපති/ විශේෂ කණිෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයකු, ලිපිකරුවකු හෝ කාර්යාල කාර්ය සහායකයකු වශයෙන් කටයුතු කිරීම.

III. ඡන්ද පෙට්ටි නිකුත් කිරීමේ ශාලාවක දී ඡන්ද පත්‍රිකා හා ඡන්ද පෙට්ටි ආදිය නිකුත් කිරීමේ හා ආපසු භාර ගැනීමේ කාර්යයන්වල නිරත වීම.

IV. ඡන්ද ගණන් කිරීමේ ශාලාවක ගණන් කිරීමේ කටයුතු කිරීම හා ප්‍රතිඵල ප්‍රකාශ කිරීමේ ශාලාවක ප්‍රතිඵල ප්‍රකාශ කිරීමේ/ වගුගත කිරීමේ කටයුතුවල නිරත වීම.

ඉහත සඳහන් දීමනා ගෙවීමට මැතිවරණ රාජකාරි සඳහා පත්වීමක් හා රාජකාරි ඉටු කළ බවට පැමිණීමේ සහතිකයක් ගෙවීම් වවුචර්වලට අමුණා තිබිය යුතුය.

ආ) දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවලින් සිදු කරන ගෙවීම්.

පහත සඳහන් කාර්යයන්වල සේවයේ නියුතු කාර්ය මණ්ඩලයට ඔවුන් සේවය කළ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයෙන් ඔවුන්ට හිමි දීමනා ගෙවනු ලැබේ.

I. පත්වීම් ලිපි/ලිපිගොනු භාර ගැනීමට කලින් දිනයක පැමිණීම.
II. දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන්ගේ උපදෙස් මත මූලික කටයුතුවල නිරත වීම.
III. සුභසාධන/සෞඛ්‍ය හා සනීපාරක්ෂක/ ප්‍රවාහන/ ශාලා සකස් කිරීම/ පොදු පහසුකම්/ සම්බන්ධීකරණ කමිටු වැනි ඒවායේ සේවය කිරීම.
IV. ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල හා වෙනත් කාර්යාලවල සංචිත වාහනවල කටයුතු කිරීම.
V. සේවා අපේක්ෂාවෙන් රැඳී සිටීම (පොරොත්තු සේවා)
VI. තේරීම්භාර නිලධාරි කාර්යාල/ මැතිවරණ කාර්යාල වලින් පමණක් ගෙවිය යුතු යැයි විශේෂයෙන් සඳහන් කර ඇති ගෙවීම්.
VII. දිස්ත්‍රික්කය තුළ පිහිටි පාසල්වල විදුහල්පතිවරුන්ගේ හා ගුරු භවතුන්ගේ මැතිවරණ රාජකාරී සඳහා ගෙවීම්.
මැතිවරණ රාජකාරී සඳහා යොදවන ලද, පාසල්වල විදුහල්පතිවරුන්ගේ හා ගුරු භවතුන්ගේ මැතිවරණ රාජකාරී ගෙවීම් සඳහා වූ ඉල්ලීම් එක් එක් පාසල පිහිටි දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය වෙත ඉදිරිපත් කළ යුතුය. මේ සඳහා මෙම චක්‍රලේඛයේ 11 වන ඡේදයේ සඳහන් උපදෙස් පරිදි ගෙවීම් වවුචර්වල මුල් පිටපත් අදාළ විදුහල්පතිවරයා හරහා මේ සමඟ අමුණා ඇති "ඊ" උපලේඛනය මඟින් ඉදිරිපත් කළ යුතුය.
VIII. ඉහත 03 ඡේදයේ (අ) අනුඡේදය යටතේ නිශ්චිතව සඳහන් නොවූ වෙනත් මැතිවරණ රාජකාරී සඳහා වූ ගෙවීම්.

ඉහත (ආ) අනුඡේදය යටතේ වූ කාර්යයන්හි සේවයේ නියුතු ස්ථිර කාර්ය මණ්ඩලය හා සේවකයින් අදාළ තේරීම්භාර නිලධාරී/ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය/ නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්ගේ උපදෙස් පරිදි අදාළ වවුචර් සහ උපකාරක ලියවිලි හැකි ඉක්මණින් තමන් සේවය කළ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය වෙත ඉදිරිපත් කිරීමට පියවර ගත යුතුය.

## 04. ගමන් වියදම් හා සංයුක්ත දීමනා

මැතිවරණ රාජකාරී සඳහා පත්කිරීමේ ලිපියකින් හා පත්කළ කාර්යය ඉටුකළ බවට පැමිණීමේ සහතිකයකින් සනාථ කෙරෙන්නේ නම් ඉහත 03 ඡේදයේ සඳහන් මැතිවරණ රාජකාරී සඳහා පහත දැක්වෙන විශේෂ අවස්ථා ද ඇතුලත්ව ආයතන සංග්‍රහයේ XIV වන පරිච්ඡේදයෙහි දැක්වෙන පරිදි ගමන් වියදම් හා සංයුක්ත දීමනා ලබා ගැනීමට නිලධාරීන්ට හිමිකම ඇත.

4.1. සහකාර තේරීම්භාර නිලධරයකු, ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයකු, අතිරේක ඡන්ද ස්ථානාධිපතිවරයකු, කණිෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයකු, විශේෂ කණිෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයකු, ඡන්ද පොළ ලිපිකරුවෙකු හෝ කාර්යාල කාර්ය සහායකයකු වශයෙන් තෝරාගෙන ඇති කවර හෝ නිලධරයකු රාජකාරී සඳහා යාමට ගමන ආරම්භ කරන ස්ථානය ලෙස සැලකිය යුත්තේ නිලධරයාගේ සේවා ස්ථානයයි. <u>ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයකු කැටුව යන රජයේ සේවකයකු නො වන කාර්යාල කාර්ය සහායකයකුගේ කල්පිත සේවා ස්ථානය ලෙස සැලකිය යුත්තේ ද ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයාගේ සේවා ස්ථානයයි.</u>

4.2. නිලධරයා තමන් පදිංචි නිවසෙහි සිට ගමන ආරම්භ කරන්නේ නම් හා එම නිවස ඔහුගේ සේවා ස්ථානයේ සිට කිලෝමීටර් 24 ක් ඇතුලත පිහිටා ඇත්නම් ඔහු එම නිවසෙහි සිට ගමන ආරම්භ කළා සේ සලකා ගෙවීම් කළ හැකිය.

4.3. දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී වෙත කල් ඇතිව වාර්තා කරන ලෙස උපදෙස් ලබාදී ඇති නිලධාරීන්ට ඔහු විසින් තාවකාලික නවාතැන් ස්ථාන සපයනු ලැබේ. එම ස්ථානවල නො රැඳී වෙනත් ස්ථානයක නවාතැන් ගතහොත් එවැනි නිලධාරියකුට ගමන් ගාස්තු ගෙවිය හැක්කේ නවාතැන් ගැනීමට නියම කළ ස්ථානයේ සිට උපරිම වශයෙන් කිලෝමීටර් 07 ක දුරක් සඳහා පමණකි.

4.4. I.මැතිවරණ රාජකාරී සඳහා හදිසි කැඳවීමක් නිසා දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයකට කෙටි කාලයකින් වාර්තා කිරීමට සිදු වූයේ නම් එවැනි අවස්ථාවක දී නිලධරයකුට වායුසමනය කළ බස්රථයකින් ගමන යාමට සිදු විය හැකිය. එවැනි අවස්ථාවක දී ගමන සඳහා බස්රථයෙන් නිකුත් කළ ප්‍රවේශ පත්‍රය ගමන් වියදම් වවුචරයට අමුණා ඉදිරිපත් කළේ නම් වායුසමනය කළ බස් රථයට ගෙවූ ගාස්තුව ලබා දිය හැකිය.

II.ආයතන සංග්‍රහයේ විධිවිධාන පරිදි සැතපුම් කුලී හිමි ක්ෂේත්‍ර නිලධරයකුට මැතිවරණ රාජකාරී සඳහා යතුරුපැදිය පාවිච්චි කිරීම වෙනුවෙන් තමන් සේවය කළ දිස්ත්‍රික්කය තුළ පමණක් කිලෝමීරයකට රු. 2.00 බැගින් සැතපුම් කුලී ගෙවිය හැකි අතර මැතිවරණ රාජකාරී සඳහා තමාගේ යතුරුපැදිය පාවිච්චි කළ බව තහවුරු කෙරෙන ලියවිල්ලක් තමන් සේවය කළ දිස්ත්‍රික්කයේ තේරීම්භාර නිලධාරී/ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය/ නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්වරයාගෙන් ලබාගෙන ගමන් වියදම් වවුචරය සමඟ ඉදිරිපත් කළ යුතුය.

4.5. I.ඡන්ද පොලක ඡන්ද විමසීමේ රාජකාරිවල යෙදීමට නියම කළ නිලධරයකු ඡන්ද විමසීමට පෙර දින රාත්‍රී තම ඡන්ද පොළෙහි හෝ දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී නියම කළ ස්ථානයක නතර වීමට උපදෙස් ලැබ, ඇත්ත වශයෙන්ම එම ස්ථානයේ රාත්‍රිය ගත කළේ නම්, ගමන් කළ දුර ප්‍රමාණය නො සලකා ආයතන සංග්‍රහයේ සඳහන් ගාස්තු ප්‍රමාණය අනුව සම්පූර්ණ සංයුක්ත දීමනාව ගෙවිය හැකිය.

II.ඡන්ද පොළෙහි නතර නොවූ තැනැත්තෙකුට වුවද ගමන් කළ දුර ප්‍රමාණය කිලෝමීටර් 11.2 කට/ සැතපුම් 07 ට අඩුවන අවස්ථාවක දී දුර ප්‍රමාණය නොසලකා සංයුක්ත දීමනාවෙන් අඩක් ගෙවිය හැකිය.

4.6. ඡන්ද ගණන් කිරීමේ කාර්යයන් සඳහා ඡන්ද ගණන් කිරීමේ මධ්‍යස්ථානයක රාත්‍රී රැඳී සිටි නිලධාරීන්ට ද ගමන් කළ දුර ප්‍රමාණය නො සලකා එදිනට පමණක් සංයුක්ත දීමනා ගෙවිය හැකිය.

4.7. ඡන්ද විමසීමට පෙර දින ඡන්ද පෙට්ටි නිකුත් කිරීමේ කාර්යයෙහි නියැලි නිලධාරීන්ට එම කාර්යය අවසන් කර නිවෙස් බලා යාමට කාල වේලාව ඇත. එහෙයින් එදින එම කටයුතුවල නිරත නිලධාරීන්ට සංයුක්ත දීමනා ගෙවිය හැක්කේ, එම කාර්යය සිදුකළ ස්ථානය ඔවුන්ගේ ස්ථිර සේවා ස්ථානය පිහිටි නාගරික බල ප්‍රදේශයෙන් බැහැරව පිහිටියේ නම් හා එම රාජකාරිවල යෙදුන ස්ථානය සංයුක්ත දීමනා ගෙවීම සඳහා ආයතන සංග්‍රහයේ සඳහන් දුරක පිහිටා ඇත්නම් නම් පමණකි.

4.8. මැතිවරණ රාජකාරී සඳහා මැතිවරණ කොමසාරිස්වරයා විසින් හෝ දිස්ත්‍රික් තේරීම්භාර නිලධරයා විසින් නියම කර ඇති දින හා වේලාවන්වල දී නිලධරයන් ගමන් කළ යුතුය. සංයුක්ත දීමනා ගෙවනුයේ සම්පූර්ණයෙන් ම මෙම පදනම මත වන අතර එසේ නියම කර ඇති දින වකවානුව තුළට අයත් නො වන ගෙවීම් සඳහා අදාල වන වියදම් ප්‍රතිපූර්ණය කරනු නො ලැබේ.

05. විශේෂ ගමන් ගාස්තු (සැතපුම් කුලී)

5.1. ප්‍රවාහන කටයුතු සම්බන්ධයෙන් මගේ අංක PE/24/2015 හා 2015.08.10 දිනැති TR/2015/13 දරණ ප්‍රවාහන චක්‍රලේඛයේ (සියළුම ප්‍රවාහන කටයුතු සඳහා වූ සාරාංශ ගත ප්‍රවාහන චක්‍රලේඛය) සඳහන් උපදෙස් අනුව ගෙවීම් කළ යුතුය. එම උපදෙස්වලට පරිබාහිරව කටයුතු කර ඇති අවස්ථාවක දී ඒ සඳහා මාගේ විශේෂ අනුමැතිය ලබාගත යුතුය.

5.2.I.දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී/ ඔහු විසින් ප්‍රවාහන කටයුතු භාරව ක්‍රියා කිරීමට බලය පවරන ලද නිශ්චිත මාණ්ඩලික නිලධාරියෙකුගේ පූර්ව අනුමැතිය යටතේ ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයෙකු තම ඡන්ද පොල වෙත ඡන්ද පෙට්ටි ආදිය රැගෙන යාම සහ ඡන්ද විමසීමෙන් පසු ඒවා ආපසු රැගෙන ඒම සඳහා තමන් විසින්ම රැගෙන ආ වාහනයක් යොදවා ගනු ලැබී නම් TR/2015/08 හා 2015.07.08 දිනැති ප්‍රවාහන චක්‍රලේඛයේ මගින් සඳහන් කර ඇති කොන්දේසි හා උපදෙස්වලට යටත්ව පෙට්‍රල් වාහන සඳහා කිලෝමීටරයකට රු.30.00 ක් හා ඩීසල් වාහන සඳහා කිලෝ මීටරයකට රු.20.00 ක් බැගින් වන පරිදි පෞද්ගලික වාහනය සඳහා ගමන් ගාස්තු ගෙවිය හැකිය.

II.ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයා තමන් විසින් රැගෙන ආ වාහනය පැදවීමට යොදා ගන්නා ලද රජයේ සේවයේ නො වන පෞද්ගලික රියදුරුට වැටුප වශයෙන් දිනකට රු. 600.00 ක් බැගින් ගෙවිය හැකිය. තවද දිනකට පැය 12 ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති අවස්ථාවන්හි දී රු. 350.00 ක් බැගින් වූ සංයුක්ත දීමනාව ද ගෙවිය හැකිය. මෙම දීමනාව ලබාගැනීම සඳහා ඉදිරිපත් කරන වවුචරය සමඟ V-3 ආකෘතියේ (ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපති විසින් රැගෙන එන පෞද්ගලික වාහන තොරතුරු ඇතුලත් කර ඇති ආකෘතිය) පිටපතක් ඉදිරිපත් කළ යුතුය. පෞද්ගලික රියදුරුගේ දීමනා ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් රියදුරුට ගෙවා ඇති විටකදී එම මුදල ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයා නමින් ප්‍රතිපූර්ණය කරනු ලැබේ. ප්‍රතිපූර්ණය කිරීම සඳහා රියදුරු විසින් තමාට හිමි මුදල් භාරගත් බවට සහතිකයක්/ ලිපියක් ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයාගේ වවුචරයට අමුණා ඉදිරිපත් කළ යුතුය.

III.ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් රැගෙන එන ලද වාහනයක් මැතිවරණ රාජකාරී සඳහා යොදා ගත්තේ නම් පමණක් එවැනි ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයකුගේ ගමන් වියදම් ඉල්ලුම්පත හා මැතිවරණ රාජකාරිවලට අදාළ අනෙකුත් වවුචර් පැමිණීමේ සහතික ද සමඟ දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී/ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය/ නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස් වෙත ඉදිරිපත් කළ යුතුය.

IV.ඡන්ද පොල රාජකාරී හැර වෙනත් මැතිවරණ රාජකාරී සඳහා සහභාගි වූ ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන්ට පෞද්ගලික වාහනයක් රැගෙන යාම වෙනුවෙන් සැතපුම් කුලිය ගෙවනු නො ලැබේ.

5.3.I. දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරි/ ඔහු විසින් ප්‍රවාහන කටයුතු භාරව ක්‍රියා කිරීමට බලය පවරන ලද නිශ්චිත මාණ්ඩලික නිලධරයකුගේ පූර්ව අනුමැතිය යටතේ ප්‍රධාන ගණන් කිරීමේ නිලධරයකු, නියෝජ්‍ය ප්‍රධාන ගණන් කිරීමේ නිලධරයකු, ගණන් කිරීමේ සහකාර තේරීම්භාර නිලධරයකු වශයෙන් පත්වීම් ලබා දී ඇති සහකාර තේරීම්භාර නිලධාරීන්ට පෞද්ගලික වාහනය හෝ කලත්‍රයාගේ වාහනයක් යොදවා ගැනීමට අවස්ථාව දී ඇත. තවද මෙම කාර්යය සඳහා විශේෂ හේතුන් මත අවිවාහක නිලධාරීන්ට තම පියා, මව, සොහොයුරු, සොහොයුරියන්ට අයත් වාහන ද විවාහක නිලධාරීන්ට තම පියා, මව, දූදරුවන් සතු වාහන ද භාවිතා කළ හැකිය. එබැවින් එම රැගෙන එනු ලබන පෞද්ගලික වාහනය පිළිබඳ තොරතුරු V-4 ආකෘතියෙන් සනාථ කෙරෙන්නේ නම් ආයතන සංග්‍රහයේ XIV පරිච්ඡේදයේ 8.2 පරිදි ඔවුන්ට පෙට්‍රල් වාහනයක් සඳහා කිලෝමීටරයකට රු.12.00 බැගින් ද ඩීසල් වාහනයක් සඳහා කිලෝමීටරයකට රු.8.00 බැගින් ද ගෙවිය හැකිය.

II. ප්‍රමාණවත් තරම් වාහන නොමැති වීම නිසා ගම්පහ, කළුතර, කෑගල්ල හා පුත්තලම යන දිස්ත්‍රික්ක තුළ පමණක් කලාප රාජකාරි සඳහා පිටතින් පැමිණෙන සහකාර තේරීම්භාර නිලධාරීන්ගේ පෞද්ගලික වාහන යෙදවීමට අවසර දී තිබුණි. එලෙස කලාපභාර සහකාර තේරීම්භාර නිලධාරීන් වශයෙන් මැතිවරණ රාජකාරි ඉටුකළ සහකාර තේරීම්භාර නිලධාරීන්ටද ඉහත 5.3.I අනුඡේදයෙහි සඳහන් ගෙවීම් කළ හැකිය. තවද කලාප රාජකාරි සඳහා රැගෙන යන වාහන යම් අවධානමකට මුහුණ දෙමින් මැතිවරණ රාජකාරිවල නිරත කරවීමට සිදුවන නිසා 5.3.III අනුඡේදයේ සඳහන් දීමනාවට අමතරව රුපියල් දහසක (රු. 1,000.00) මුදලක් සම්පූර්ණ ධාවන කාලසීමාව සඳහා ගෙවිය හැකිය.

III. පෞද්ගලික වාහනය රැගෙන යනු ලැබූ ඉහත 5.3.I හා 5.3.II හි අනුඡේදයන්හි සඳහන් නිලධාරීන්ට වාහනය ධාවනය කළ දුර අනුව ගමන යාමට හා ඊමට (සම්පූර්ණ ගමනට) පහත සඳහන් පරිදි විශේෂ දීමනාවක් ගෙවිය හැකිය. මෙම දීමනාව ලබා ගැනීම සඳහා වාහනය භාවිතා කළ නිලධරයා විසින් පොදු 35 වවුචරයක අත්සන් කර ගමන් වියදම් වවුචරය සමඟ ඉදිරිපත් කළ යුතුය.

| | |
|---|---|
| අ. සේවා ස්ථානය පිහිටි දිස්ත්‍රික්කය තුළ | රු. 300.00 |
| ආ. ස්වකීය නිත්‍ය සේවා ස්ථානයේ සිට මැතිවරණ රාජකාරිවල නිරත වූ දිස්ත්‍රික්කයේ ප්‍රධාන නගරයට දුර කි.මී. 50 දක්වා | රු. 450.00 |
| ඇ. ස්වකීය නිත්‍ය සේවා ස්ථානයේ සිට මැතිවරණ රාජකාරිවල නිරත වූ දිස්ත්‍රික්කයේ ප්‍රධාන නගරයට දුර කි.මී. 100 දක්වා | රු. 600.00 |
| ඇ. ස්වකීය නිත්‍ය සේවා ස්ථානයේ සිට මැතිවරණ රාජකාරිවල නිරත වූ දිස්ත්‍රික්කයේ ප්‍රධාන නගරයට දුර කි.මී. 150 දක්වා | රු. 750.00 |
| ඉ. ස්වකීය නිත්‍ය සේවා ස්ථානයේ සිට මැතිවරණ රාජකාරිවල - නිරත වූ දිස්ත්‍රික්කයේ ප්‍රධාන නගරයට දුර කි.මී. 150 ට වැඩි | රු. 900.00 |

5.4. ප්‍රධාන ගණන් කිරීමේ නිලධරයකු, නියෝජ්‍ය ප්‍රධාන ගණන් කිරීමේ නිලධරයකු, ගණන් කිරීමේ සහකාර තේරීම්භාර නිලධරයකු හෝ කලාප භාර සහකාර තේරීම්භාර නිලධරයකු තම වාහනය සඳහා පෞද්ගලික රියදුරකු රැගෙන යාමට දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරි/ ඔහු විසින් ප්‍රවාහන කටයුතු භාරව ක්‍රියා කිරීමට බලය පවරන ලද නිලධරයකු විසින් අවසර දී ඇත්නම් එම වාහනවල පෞද්ගලික රියදුරන්ට 5.2 (II) සඳහන් පරිදි දීමනා ගෙවිය හැකිය. එම ගෙවීම් ලබාගැනීම සඳහා රියදුරුගේ නමින් වවුචරයක් පිළියෙල කර V-5 ආකෘතියේ (පෞද්ගලික වාහනය රැගෙන එන රියදුරුගේ පැමිණීමේ සහතිකය) පිටපතක් සමඟ ඉදිරිපත් කළ යුතු අතර එය රියදුරු සේවය කළ නිලධරයාගේ වවුචර් සමඟ ඉදිරිපත් කළ යුතුය. පෞද්ගලික වාහන රැගෙන යන්නන්ගේ රියදුරුගේ ගෙවීම් කිසිවක් නිලධරයාගේ නමින් ප්‍රතිපූර්ණය කරනු නොලැබේ. පෞද්ගලික රියදුරුගේ දීමනා සඳහා රියදුරුගේ නමට ලියන ලද චෙක්පතකින් ගෙවිය යුතුය.

5.5. මෙසේ පෞද්ගලික මෝටර් රථය පාවිච්චි කිරීම වෙනුවෙන් ගෙවීම් කළ හැක්කේ මෙම ගමන් ගාස්තු (සැතපුම් කුලී) හිමි නිලධාරීන්ට පමණක් වන අතර, ආයතන සංග්‍රහයේ XIV පරිච්ඡේදයේ සඳහන් සියළු නියමයන්ට හා සීමාවන්ට යටත්වය.

5.6.I මැතිවරණ රාජකාරි සඳහා යොදවනු ලබන වෙන් කළ වාහන සඳහා නියමිත දිස්ත්‍රික්කයට යාමට/ ඊමට අවශ්‍ය ඉන්ධන සඳහා වැයවූ මුදල් ප්‍රතිපූර්ණය කිරීම පිණිස හඳුන්වා දී ඇති AV-1 ආකෘතිය හා පොදු 35 වවුචරයක් සම්පූර්ණ කර එහි පිටුපස අත්සන් තබා අදාළ බිල්පත් සමඟ මැතිවරණ මහලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කිරීමෙන් නිලධරයා නමින් එම වියදම ප්‍රතිපූර්ණය කරවා ගත හැකිය.

II. සංචිත වාහනවලට ලබාගත් ඉන්ධන වියදම් ප්‍රතිපූර්ණය කිරීමට හඳුන්වා දී ඇති PV-1 ආකෘතිය සම්පූර්ණ කර මැතිවරණ මහලේකම් කාර්යාලයට ඉදිරිපත් කිරීමෙන් එම ඉන්ධන වියදම අදාළ ආයතනය නමින් ප්‍රතිපූර්ණය කර ගත හැකිය.

5.7. මැතිවරණ රාජකාරි සඳහා පුද්ගලික වාහනය රුගෙන යාමට/ ඒමට අවසර දී ඇති නිලධාරීන් ගමන සඳහා අධිවේගී මාර්ගය භාවිතා කලේ නම් එම ගාස්තුව ප්‍රතිපූර්ණය කළ හැකිය. ඒ සඳහා අදාල ප්‍රවේශ පත්‍රයේ සහතික කළ ඡායා පිටපතක් ගමන් වියදම් වවුචරයට අමුණා ඉදිරිපත් කළ යුතුය.

## 06. රජයේ සේවයේ නොවන සේවකයින් සඳහා ගෙවීම්

6.1. ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපති විසින් සේවයෙහි යොදවනු ලබන රජයේ සේවකයෙකු නොවන කාර්යාල කාර්ය සහායකයකුට ඡන්ද විමසීමට අදාල මුළු කාර්යය සඳහා මෙහි 7.1 හි සඳහන් කාර්යාල කාර්ය සහායක දීමනාව ගෙවිය හැකිය.

6.2. එවැනි සේවකයෙකුට ආයතන සංග්‍රහයේ සඳහන් පරිදි දිනක අවම සංයුක්ත දීමනාව වූ රු. 350.00 බැගින් අදාල දින ගණන සඳහා ගෙවිය හැකිය. සේවකයකු මැතිවරණ රාජකාරි සඳහා කැටුව ගියේ නම් එම ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් සේවකයාට හිමි මුදල ගෙවා එම මුදල ප්‍රතිපූර්ණය කර ගත හැකිය.

6.3. සහකාර තේරීම්භාර නිලධරයකුට ස්වකීය මැතිවරණ රාජකාරි ගමනේ දී කාර්යාල කාර්ය සහායකයකු හෝ වෙනත් අයෙකු රුගෙන යාම සඳහා අවසර දී නොමැති හෙයින් සහකාර තේරීම්භාර නිලධරයකු කැටුව යන කාර්යාල කාර්ය සහායකයින් සඳහා ගෙවීම් නො කළ යුතුය.

## 07. දීමනා

7.1. දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී විසින් ලිඛිතව පත්වීමක් කරනු ලැබ මැතිවරණ රාජකාරිවල නිරත වූ නිලධරයකු/ සේවකයකු පහත සඳහන් පරිදි වූ පැමිණීමේ සහතිකයකින් ඒ බව සනාථ කරන්නේ නම් ඔවුනට එක් එක් කාර්යයන් සඳහා පහත පරිදි දීමනා ගෙවිය හැකිය.

| කාර්ය මණ්ඩලය | ගෙවිය යුතු දීමනාව | පැමිණීමේ සහතිකයේ අංකය |
|---|---|---|
| කලාප භාර සහකාර තේරීම්භාර නිලධාරීන් සඳහා | රු.3,750.00 | CE 46 |
| ඡන්ද ප්‍රදේශ/ ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් පිහිටවනු ලැබූ ප්‍රාදේශීය සම්බන්ධීකරණ කාර්යාලයක සහකාර තේරීම්භාර නිලධාරීන් සඳහා | රු.3,750.00 | CE 52 |
| ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් සඳහා | රු.3,500.00 | CE 19/1 |
| අතිරේක ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් සඳහා | රු.3,000.00 | CE 19 |
| කණිෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් / ලිපිකරුවන් සඳහා | රු.2,000.00 | CE 19 |
| විශේෂ කණිෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් සඳහා | රු.2,100.00 | CE 19 |
| කාර්යාල කාර්ය සහායකයින් සඳහා | රු.1,450.00 | CE 19 |

7.2. ඡන්ද පෙට්ටි නිකුත් කිරීම සඳහා CE 47 දරණ මුද්‍රිත ආකෘතියේ වූ පැමිණීමේ සහතිකයකින් සනාථ කෙරෙන්නේ නම් ඡන්ද විමසීමට පෙර දින ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් වෙත ඡන්ද පෙට්ටි හා ඡන්ද පත්‍රිකා ආදිය නිකුත් කිරීමේ යෙදුන නිලධාරීන්ට ද ඡන්ද පෙට්ටි ආපසු භාර ගැනීම සඳහා CE 48 දරණ මුද්‍රිත ආකෘතියේ වූ පැමිණීමේ සහතිකයකින් සනාථ කෙරෙන්නේ නම් ඡන්ද විමසීමේ දින පස්වරුවේ ඡන්ද පෙට්ටි ආදිය ආපසු භාර ගැනීමේ යෙදුනා වූ නිලධාරීන්ට ද එම එක් එක් දින කාර්යයන් සඳහා පහත සඳහන් පරිදි ගෙවීම් කළ හැකිය.

| | |
|---|---|
| සහකාර තේරීම්භාර නිලධාරී | රු. 1,000.00 |
| ජ්‍යෙෂ්ඨ/ කණිෂ්ඨ ඡන්ද ස්ථානාධිපති හා ලිපිකරු | රු. 800.00 |
| කණිෂ්ඨ සේවක | රු. 700.00 |

CE 47 හෝ CE 48 දරණ මුද්‍රිත ආකෘතියේ වූ පැමිණීමේ සහතික හැර වෙනත් ආකෘති අනුව පැමිණීමේ සහතික ඉදිරිපත් කරන නිලධාරීන්ට මෙම දීමනා නො ගෙවිය යුතුය.

7.3. නිලධාරියෙකුට ගෙවිය හැක්කේ 7.1 හෝ 7.2 හි සඳහන් දීමනාවන් අතුරින් එකක් පමණි. එහෙත් අවශ්‍ය නිලධාරීන් ප්‍රමාණවත් නො වීම නිසා හෝ විශේෂ අවස්ථාවක දී කලාපභාර සහකාර තේරීම්භාර නිලධරයකු වශයෙන් සේවය කළ නිලධරයකුට ප්‍රධාන ගණන් කිරීමේ නිලධරයකු වශයෙන් සේවය කිරීම සඳහා පත්වීම් ලිපියක් ලබා දී තිබුණහොත් ඔහුට අදාල ගෙවීම් කළ හැකිය. එසේම විශේෂ කරුණු හේතුවෙන් භාර ගැනීමේ කටයුතු සඳහා සහ ඡන්ද මධ්‍යස්ථාන රාජකාරි සඳහා සහභාගී කරවා ඇති නිලධාරීන්ට දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය/ නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්වරුන්ගේ හෝ අතිරේක මැතිවරණ කොමසාරිස් (නීති හා විමර්ශන)/ නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස්(පාලන) ගේ පැමිණීමේ සහතිකයක් මත එම දීමනා දෙකම ගෙවිය හැකිය.

7.4. ඡන්ද ගණන් කිරීමේ හා ප්‍රතිඵල ප්‍රකාශ/වගුගත කිරීමේ කාර්යයනට පමණක් යොදවා ගනු ලබන නිලධාරීන්ට ඉහත 7.1 හෝ 7.2 හි සඳහන් දීමනා නො ගෙවිය යුතුය.

7.5. දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී විසින් ලිඛිතව පත්වීමක් කරනු ලැබ (ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරීන් සඳහා PE-6 දරණ ආකෘතියේ වූ පත්වීමකට) ඡන්ද ගණන් කිරීමේ රාජකාරිවල නිරත වූ නිලධරයකු/ සේවකයකු පහත සඳහන් පරිදි වූ පැමිණීමේ සහතිකයකින් ඒ බව සනාථ කරන්නේ නම් ඔවුනට එක් එක් කාර්යයන් සඳහා පහත පරිදි දීමනා ගෙවිය හැකිය.

| කාර්ය මණ්ඩලය | පළමු තිරුව | දෙවන තිරුව | තුන්වන තිරුව | පැමිණීමේ සහතිකයේ අංකය |
|---|---|---|---|---|
| ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරීන්ට | රු. 6,250.00 | රු. 6,500.00 | රු. 6,750.00 | CE 50 |
| නියෝජ්‍ය ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරීන්ට | රු. 4,250.00 | රු. 4,500.00 | රු. 4,750.00 | CE 54 |
| සහකාර තේරීම්භාර නිලධාරීන්ට | රු. 3,500.00 | රු. 3,750.00 | රු. 4,000.00 | CE 49 |
| ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන්ට | රු. 2,300.00 | රු. 2,450.00 | රු. 2,600.00 | CE 49 |
| කණිෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන්/ ලිපිකරුවන්ට | රු. 2,000.00 | රු. 2,150.00 | රු. 2,300.00 | CE 49 |
| කාර්යාල කාර්ය සහායකයින්ට | රු. 1,250.00 | රු. 1,350.00 | රු. 1,450.00 | CE 49 |

I. පළමු තිරුවට අයත් වන්නේ තරඟ කරනු ලබන පක්ෂ/ ස්වාධීන කණ්ඩායම් සංඛ්‍යාව 17 ට අඩු ගාල්ල, මාතර, හම්බන්තොට, පොළොන්නරුව, බදුල්ල හා මොණරාගල යන දිස්ත්‍රික්ක වේ.

II. දෙවන තිරුවට අයත් වන්නේ තරඟ කරනු ලබන පක්ෂ/ස්වාධීන කණ්ඩායම් සංඛ්‍යාව 18 සිට 24 දක්වා වූ කළුතර, මහනුවර, මාතලේ, නුවරඑළිය, යාපනය, ත්‍රිකුණාමලය, පුත්තලම, අනුරාධපුරය, රත්නපුරය හා කෑගල්ල යන දිස්ත්‍රික්ක වේ.

III. තුන්වන තිරුවට අයත් වන්නේ තරඟ කරනු ලබන පක්ෂ/ ස්වාධීන කණ්ඩායම් සංඛ්‍යාව 25 ට වැඩි කොළඹ, ගම්පහ, වන්නි, මඩකලපුව, දිගාමඩුල්ල හා කුරුණෑගල යන දිස්ත්‍රික්ක වේ.

7.6. දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී විසින් ලිඛිතව පත්වීමක් කරනු ලැබ ප්‍රතිඵල ප්‍රකාශ/ වගුගත කිරීමේ රාජකාරිවල නිරත නිලධාරීන්ට CE 55 පැමිණීමේ සහතිකයෙන් සනාථ වන්නේ නම් ඉහත 7.5 යටතේ වූ වගුවේ සඳහන් පරිදි එක් එක් නිලධරයා/ සේවකයාගේ මැතිවරණ රාජකාරියට අදාළ තනතුර අනුව ඉහත සඳහන් දීමනාව ගෙවිය හැකිය.

7.7. CE 53 දරණ මුද්‍රිත ආකෘතියේ වූ පැමිණීමේ සහතිකයකින් සනාථ කෙරෙන්නේ නම් පමණක් ප්‍රවාහන, සුබ සාධන, පොදු පහසුකම් වැනි කමිටුවල රාජකාරී ඉටු කළ කාර්යය මණ්ඩලයට ඔවුන්ව පත් කර ඇති තනතුර අනුව 7.2 හා 7.5 හි සඳහන් දීමනා ඔහු සේවය කළ මැතිවරණ කාර්යාලයෙන් ගෙවීමට ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය/ නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්ට විශේෂ උපදෙස් ලබා දී ඇත. මෙම දීමනාව තම ස්ථිර සේවා ස්ථානයෙන් ලබා නො ගතයුතු අතර එසේ ලබා ගෙන ඉදිරිපත් කරනු ලබන ගෙවීම් මැතිවරණ කාර්යාලයෙන් ප්‍රතිපූර්ණය කරනු නො ලැබේ.

7.8. CE 56 දරණ මුද්‍රිත ආකෘතියේ වූ පැමිණීමේ සහතිකයකින් සනාථ කෙරෙන්නේ නම් පමණක් ශාලා සම්බන්ධීකරණ කාර්ය මණ්ඩලය සඳහා දීමනාවක් ගෙවිය හැකිය. මෙම දීමනාව ඔහු සේවය කළ මැතිවරණ කාර්යාලයෙන් ගෙවීමට ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය/ නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්ට විශේෂ උපදෙස් ලබා දී ඇත. මෙම දීමනාව තම ස්ථිර සේවා ස්ථානයෙන් ලබා නො ගතයුතු අතර එසේ ලබා ගෙන ඉදිරිපත් කරනු ලබන ගෙවීම් මැතිවරණ කාර්යාලයෙන් ප්‍රතිපූර්ණය කරනු නො ලැබේ.

7.9. ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරී සඳහා සහායකයෙකු රැගෙන යාමට මවිසින් උපදෙස් දී ඇති හෙයින් ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරී විසින් එවැනි අයෙකු රැගෙන ගොස් ඇත්නම් ඔහුගේ පත්වීම් ලිපිය හා පැමිණීමේ සහතිකය මගින් සනාථ කෙරෙන්නේ නම් ගණන් කිරීමේ ශාලාවේ මැතිවරණ රාජකාරියෙහි යෙදවූ තනතුර අනුව 7.5 හි සඳහන් දීමනා අතුරින් එක් තනතුරකට අදාළ දීමනාවක් ගෙවිය හැකිය.

7.10. මැතිවරණ කොමසාරිස්වරයාගේ උපදෙස් මත විශේෂයෙන් පවරන ලද මැතිවරණ රාජකාරී ඉටුකළ නිලධාරීන් සිටී නම් එවැනි තැනැත්තන්ට ගෙවිය යුතු දීමනා සඳහා අදාළ වටවර එම විශේෂ රාජකාරී ඉටුකළ දිස්ත්‍රික්කයේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය/ නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස් වෙත ඉදිරිපත් කිරීමට උපදෙස් දිය යුතුය.

7.11. රජයේ සේවයේ නියුතු රියදුරන්ට හැර ඉහත සඳහන් 7.1, 7.2 හා 7.5 අනු ඡේද යටතේ සඳහන් දීමනා ලබා ගන්නා නිලධාරීන්ට හා සේවකයන්ට එම කාලසීමාව සඳහා අතිකාල හෝ නිවාඩු දින වැටුප් නො ගෙවිය යුතුය.

08. රජයේ වාහනවල රියදුරන්ට ගෙවීම්

8.1. මැතිවරණ කොමසාරිස්ගේ හෝ දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන්ගේ ඉල්ලීම පරිදි අගෝස්තු මස 14 වෙනි දින සිට අගෝස්තු මස 19 දින දක්වා (එම දෙදින ද ඇතුලත්ව) සීමාව තුළ පමණක් ඡන්ද විමසීමට අදාල රාජකාරිවල යොදවන ලද වාහනවල රියදුරන්ට CE 51 දරණ මුද්‍රිත ආකෘතියේ වූ පැමිණීමේ සහතිකයකින් සනාථ වන්නේ නම් රජයේ කාර්යාල/ ආයතනවල ස්ථිර සේවයේ නිරත රියදුරන්ගේ අතිකාල, ගමන් වියදම් හා සංයුක්ත දීමනා ඔවුන්ගේ ස්ථිර සේවා ස්ථානයෙන් ගෙවිය යුතු අතර, මැතිවරණ කොමසාරිස් වෙතින් එම ගෙවීම් ප්‍රතිපූර්ණය කරවා ගත හැකිය.

8.2. එසේ වුවද මැතිවරණ රාජකාරි වලට අදාලව සේවයේ යෙදුන පහත සඳහන් රියදුරන්ගේ ගෙවීම් සඳහා වූ වවුචර් ඔවුන් සේවය කල දිස්ත්‍රික්කයේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය/ නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස් වෙත ඉදිරිපත් කළ යුතුය.

I. <u>අගෝස්තු මස 14 වෙනි දින සිට අගෝස්තු මස 19 දින දක්වා වූ දින 06 ක කාලසීමාවෙන් බැහැර වූ දිනයන්හි දී මැතිවරණ කටයුතුවලට අදාලව සේවයේ නිරතව ඇති රියදුරන්ගේ ගෙවීම්.</u>

II. <u>දිස්ත්‍රික් ලේකම් කාර්යාලයන්හි රියදුරන් හා එම දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලින් වැටුප් ලබන වෙනත් රජයේ කාර්යාලවල රියදුරන්ගේ ගෙවීම්.</u>

III. <u>ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි රියදුරන් හා එම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් වැටුප් ලබන වෙනත් කාර්යාලවල රියදුරන්ගේ ගෙවීම්.</u>

ඉහත 8.2 අනුජේදය යටතේ දක්වා ඇති කාණ්ඩවලට අයත්වන රියදුරන් සඳහා තම ස්ථිර සේවා ස්ථානවලින් ගෙවීම් නො කලයුතු අතර එවැනි ගෙවීම් ප්‍රතිපූර්ණය සඳහා කරන ඉල්ලීම් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

8.3. මැතිවරණ දිනවල වුව ආරක්ෂක අවශ්‍යතාව සඳහා පොලිස් ස්ථානවල සේවයේ යොදවන ලද වාහනවල රියදුරන්ට ගමන් වියදම් හා අතිකාල ගෙවීම පොලිස් දෙපාර්තමේන්තුව විසින් සිදුකරනු ලබන හෙයින් ඔබ විසින් එවැනි ගෙවීම් සිදු නො කළ යුතුය.

8.4. මැතිවරණ රාජකාරිවල යෙදවූ රියදුරු මහතුන් සඳහා පොරොත්තු සේවා වෙනුවෙන් අතිකාල ගෙවිය යුත්තේ ආයතන සංග්‍රහයේ VIII පරිච්ජේදයේ 6.2 උප වගන්තිය අනුවය.

09. මැතිවරණ උපදෙස් පන්තිවලට සහභාගීවීම සඳහා ගෙවීම්

9.1. නිලධාරීන්ට වියදමක් නොමැතිව සහභාගීවීමට හැකි වන පරිදි උපදෙස් පන්ති පැවැත්වීමට සියළු ප්‍රයත්නයන් දරනු ලැබ ඇත. කෙසේ වුවද, උපදෙස් පන්තිවලට සහභාගීවීම සඳහා දරන ලද ගමන් වියදම් ලබා ගැනීමට අපේක්ෂා කරන නිලධාරීන් ඒ සඳහා තම ගමන් වියදම් වවුචර් උපදෙස් පන්ති සඳහා කැඳවීම් සිදු කළ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය/ නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස් වෙත ඉදිරිපත් කළ යුතුය. උපදෙස් පන්ති පවත්වනු ලැබුවේ රාජගිරිය මැතිවරණ මහලේකම් කාර්යාලයේ කැඳවීම මත නම් ඒ සඳහා වූ ගමන් වියදම් වවුචර් මැතිවරණ මහලේකම් කාර්යාලයේ නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස්(පාලන) වෙත ඉදිරිපත් කළයුතුය.

9.2. උපදෙස් පන්තිවලට යාම සඳහා කුලී මෝටර් රිය ගාස්තු හෝ ඉල්ලා ගත් වාහනවලට ගමන් ගාස්තු / සැතපුම් කුලී ගෙවනු නො ලැබේ. තම පෞද්ගලික / කලත්‍රයාගේ වාහනය ඒ සඳහා භාවිතා කළ බව උපදෙස් පන්ති පැවැත්වීම සඳහා කැඳවීම් කළ මාණ්ඩලික නිලධරයා විසින් නිකුත් කළ විධිමත් සහතිකයකින් සනාථ කලහොත් පමණක් පෞද්ගලික වාහනය සඳහා ගමන් ගාස්තු / සැතපුම් කුලී ගෙවිය හැකිය. එසේ වුවද ගෙවීම් කිරීමට පෙර උපදෙස් පන්තියට සහභාගී වූ නිලධරයා මෙම කාර්යයට පාවිච්චි කළ වාහනය පෙට්‍රල් ද / ඩීසල් ද යන වග ගෙවීම් කරනු ලබන නිලධරයා විසින් තහවුරු කර ගත යුතුය.

9.3. උපදෙස් පන්තිවලට සහභාගි වූ නිලධාරීන්ට ගෙවීම් කිරීම සඳහා මුදල් වෙන්කර දෙන ලෙස ආයතන ප්‍රධානීන් නො ඉල්ලිය යුතුය. එසේම උපදෙස් පන්ති සඳහා සහභාගී වූවන්ට තම ස්ථිර සේවා ස්ථානයෙන් ගෙවීම් කර එම මුදල් ප්‍රතිපූර්ණය කරන ලෙස මැතිවරණ කොමසාරිස්ගෙන් හෝ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය/ නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්වරයාගෙන් ඉල්ලීම් නො කළ යුතුය.

9.4. උපදෙස් පන්තිවලට සහභාගි වීම වෙනුවෙන් ගමන් වියදම් හා සංයුක්ත දීමනා හැර නිවාඩු දින වැටුප්, අතිකාල හෝ වෙනත් දීමනා ගෙවනු නො ලැබේ.

10. තම ස්ථිර සේවා ස්ථානයෙන් සිදු කරන ලද ගෙවීම් ප්‍රතිපූර්ණය කිරීමට ඉදිරිපත් කළයුතු උපලේඛන

10.1. මෙම චක්‍රලේඛය අනුව තම ස්ථිර සේවා ස්ථානවලින් ගෙවීම් කළ නිලධාරීන්ගේ විස්තර (රියදුරන්ගේ හැර) අමුණා ඇති "ඒ ආකෘතිය" අනුව සම්පූර්ණ කරන ලද උපලේඛනයක් මඟින් මැතිවරණ මහලේකම් කාර්යාලය වෙත එවීමෙන් එම මුදල ප්‍රතිපූර්ණය කර ගැනීමට හැකිය.

10.2. මෙහි 8.1 අනුඡේදය යටතේ රජයේ වාහනවල රියදුරන්ට අතිකාල, ගමන් වියදම් හා සංයුක්ත දීමනා ගෙවීම් පිළිබඳ විස්තර අමුණා ඇති "බී ආකෘතිය" අනුව සම්පූර්ණ කරන ලද උපලේඛනයක් මඟින් මැතිවරණ මහලේකම් කාර්යාලය වෙත එවීමෙන් එම ගෙවීම් ප්‍රතිපූර්ණය කරවා ගත හැකිය.

10.3. ඉහත කී උපලේඛන සමඟ <u>ගෙවීම් වවුචර්වල මුල් පිටපත් මවෙත නො එවිය යුතුය. ඒවා ගෙවීම් කළ ආයතනයේ විගණන අවශ්‍යතාව සඳහා තබාගත යුතුය.</u>

10.4. ගෙවීම් උපලේඛන පමණක් මෙම කාර්යාලයට ඉදිරිපත් කළ යුතු අතර ෆැක්ස් මඟින් එවන උපලේඛනවලට ගෙවීම් කරනු නො ලැබේ.

10.5. සපයා ඇති ආදර්ශ ආකෘතිපත් අනුව අපේක්ෂිත තොරතුරු සම්පූර්ණව හා නිවැරදිව සැපයිය යුතුය. එසේම නිලධාරීන්ට ගෙවනු ලබන විවිධ දීමනා වෙන් වෙන් වශයෙන් නිවැරදිව අදාළ තීරුවල ඇතුළත් කළ යුතුය. අසම්පූර්ණ හෝ සදොස් තොරතුරු ඉදිරිපත් කරණු ලබන අවස්ථාවල දී විමසීම් කිරීමට හා නිවැරදි තොරතුරු සොයා බැලීමට සිදුවන හෙයින් එවැනි ගෙවීම් ප්‍රමාද වීමට ඉඩ ඇති බව කාරුණිකව සලකන්න.

10.6. අමාත්‍යාංශ හා රජයේ දෙපාර්තමේන්තුවල නිලධාරීන්ට එම කාර්යාලවල අක්මුදල් මඟින් ද, සංස්ථා පළාත් පාලන ආයතන වැනි වෙනත් කාර්යාලවල නිලධාරීන්ට එම ආයතනවල අරමුදල් මඟින් ද, මෙම ගෙවීම් කළ හැකිය.

11. පාසල්වල විදුහල්පතිවරුන්ගේ හා ගුරු භවතුන්ගේ මැතිවරණ රාජකාරි ගෙවීම්

පාසල්වල විදුහල්පතිවරුන්ගේ හා ගුරු භවතුන්ගේ මැතිවරණ රාජකාරි සඳහා වූ දීමනා ලබාගැනීම සඳහා මේ සමඟ අමුණා ඇති "සී" ආකෘතිය භාවිතා කළයුතු අතර අදාළ වවුචර්වල මුල් පිටපත් උපලේඛනයක් ලෙස සකස් කර විදුහල්පතිවරයා හරහා පාසල පිහිටි දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය වෙත ඉදිරිපත් කළ යුතුය. ඒ සඳහා වූ ගෙවීම් පාසල් සංවර්ධන සමිති ගිණුමට චෙක්පතකින් ලබාදීමට කටයුතු කරනු ලැබේ.

12. ප්‍රතිපූර්ණය කරනු ලබන ගෙවීම්වලට අදාළ උපලේඛන සකස් කිරීම

12.1. ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරි, නියෝජ්‍ය ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරි, කලාපභාර සහකාර තේරීම්භාර නිලධාරි, ඡන්ද පෙට්ටි නිකුත් කිරීම, භාර ගැනීම, ගණන් කිරීම භාර සහකාර තේරීම්භාර නිලධාරීන්, ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන්, අතිරේක ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන්, කණිෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන්, විශේෂ කණිෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන්, ලිපිකරුවන් හා කාර්යාල කාර්ය සහායකයින් වශයෙන් සේවය කළ කාර්ය මණ්ඩලයට ගෙවීම් අමුණා ඇති "ඒ ආකෘතිය" යටතේ නිවැරදිව ඇතුළත් කර ඉදිරිපත් කළ යුතුය.

12.2. I එක් එක් නිලධාරීන්ට ගෙවනු ලබන ගමන් වියදම්, සංයුක්ත දීමනා හා යැතපුම් කුලීවල එකතුව "ඒ" ආකෘතියේ 5 වන තීරුව යටතේ දැක්විය යුතුය. රජයේ සේවයේ නො වන රියදුරන්/ කාර්යාල කාර්ය සහායකයින් වෙත ගෙවන ගමන් වියදම් හා සංයුක්ත දීමනා "ඒ" ආකෘතියේ 9 වන තීරුවේ දැක්විය යුතුය.

II ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයකු විසින් ඡන්ද පොළ කටයුතු සඳහා කාර්යාල කාර්ය සහායකයකු වශයෙන් රජයේ සේවයේ නොවන අයකු සේවයේ යොදා ගෙන ඇති අවස්ථාවකදී ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයා නමින් ම එම කාර්යාල කාර්ය සහායකගේ ගමන් වියදම්, සංයුක්ත දීමනා හා ඡන්ද පොළ දීමනා ලබා ගත්තේ නම් එම ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයාගේ තම ඉදිරියේ කාර්යාල කාර්ය සහායකගේ ගමන් වියදම් හා සංයුක්ත දීමනා "ඒ" ආකෘතියේ 5 වන තීරුවේ ඇතුලත් කර ඡන්ද පොළ දීමනාව පමණක් 9 වන තීරුවේ ද දැක්විය යුතුය.

III ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයකු විසින් ඡන්ද පොළ කටයුතු සඳහා කාර්යාල කාර්ය සහායකයකු වශයෙන් රජයේ සේවයේ නො වන අයකු යොදා ගෙන ඇති විට ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයා නමින් එම ගෙවීම් ලබා නො ගෙන සේවකයාගේ නමින් වවුචර් ඉදිරිපත් කර ඇති අවස්ථාවක දී "ඒ" ආකෘතියේ 2 වන තීරුවේ ස්ථිර තනතුර යටතේ "රජයේ සේවයේ නොවන සේවක" යනුවෙන් සඳහන් කර ඉහත 12.2 (II) පරිදි ගමන් වියදම් හා සංයුක්ත දීමනාව "ඒ" ආකෘතියේ 5 වන තීරුවේ ද ඡන්ද පොළ දීමනාව 9 වන තීරුවේ ද දැක්විය යුතුය.

12.3. තම නිත්‍ය රාජකාරි සඳහා වාහනයක් (Assigned Vehicle) වෙන්කර ඇති නිලධරයකු මැතිවරණ රාජකාරි සඳහා එම වාහනය රැගෙන ගොස් ඇති අවස්ථාවන්හි දී එම වාහනය පැදවූ රජයේ සේවයේ රියදුරුට කරන ලද ගෙවීම් ද "බී ආකෘතියෙහි" සඳහන් කළ යුතු අතර එම රියදුරුගේ නම ඉදිරියෙන් 4 වන තීරුවේ වාහනය මැතිවරණ රාජකාරි සඳහා රැගෙන ගිය මාණ්ඩලික නිලධරයාගේ නම සඳහන් කළ යුතුය. දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී වෙත වාර්තා කළ සංචිත වාහනයක් (Pool Vehicle) නම් 4 වෙනි තීරුව හිස්ව තැබිය යුතුය.

12.4. ප්‍රතිපූර්ණය සඳහා ඉදිරිපත් කරනු ලබන උපලේඛනයේ ප්‍රතිපූර්ණ චෙක්පත ලිවිය යුතු ආකාරය ඉංග්‍රීසි භාෂාවෙන් සඳහන් කළ යුතුය.

13. ගෙවීම් කඩිනම් කිරීම සඳහා කාර්යාලයීය නිලධාරීන්ට ගෙවන දීමනා

13.1. සියළුම නිලධාරීන්ගේ ගමන් වියදම්, අතිකාල හා දීමනා ඡන්ද විමසීමේ දින සිට දින 75 ක් ඇතුලත ගෙවා අවසන් කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

13.2. මැතිවරණ රාජකාරි සඳහා නිලධාරීන් විශාල පිරිසක් යෙදවීමට සිදු වූ කාර්යාලවල කාර්ය මණ්ඩලයට හිමි දීමනා ඉක්මනින් ලබා ගැනීම පහසු කරවීම සඳහා අදාළ වවුචර් පරීක්ෂා කිරීම, සහතික කිරීම, උපලේඛන ගත කිරීම, චෙක්පත් ලිවීම, ගෙවීම් හා ගිණුම් තැබීම යනාදී සියළුම කාර්යයන් හි යෙදෙන කාර්යාලයීය නිලධාරීන්ට දිරිදීමනාවක් ගෙවීමට හැකිවන පරිදි මුදල් සපයා දෙනු ලැබේ.

13.3. මෙම චක්‍රලේඛයට අමුණා ඇති "ඒ" හා "බී" ආකෘති අනුව සකස් කළ මැතිවරණ කාර්ය මණ්ඩල ගෙවීම් උපලේඛන නිවැරදිව හා ඉක්මණින් මැතිවරණ කොමසාරිස් වෙත ඉදිරිපත් කිරීම අනුව 13.2 හි සඳහන් දිරිදීමනාව ගෙවීමට ප්‍රතිපූර්ණය කරනු ලබන අවස්ථාවේදී අතිරේක මුදලක් ඔබ වෙත සපයා දෙනු ලැබේ.

13.4. කෙසේ වුවද, ඡන්ද විමසීමේ දින සිට දින 75 කට පසුව මැතිවරණ කොමසාරිස් වෙත ලැබෙන උපලේඛන සඳහා ද, මෙම උපදෙස් වලින් බැහැර වෙමින් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය/ නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් වෙත ලැබෙන උපලේඛන සඳහා ද, සකස් කිරීමේ දෝෂ, යතුරු ලිවීමේ දෝෂ, එකතු කිරීමේ දෝෂ සහිතව ඉදිරිපත් කරන උපලේඛන සඳහා ද නිලධාරීන් 10 කට අඩු සංඛ්‍යාවකගේ ගෙවීම් ඇතුලත් උපලේඛන සඳහා ද ඉහත කී අතිරේක මුදල් සපයනු නො ලැබේ.

13.5. ගෙවීම් උපලේඛන මෙම කාර්යාලයට එවීමට පෙර එමගින් ඉල්ලා ඇති සියළු විස්තර නිවැරදිව ඇතුලත්ව තිබේදැයි යන්න පරීක්ෂා කර බලන ලෙස ද, ගෙවිය යුතු මුදල් ප්‍රමාණ පිළිබඳ විස්තර යතුරු ලිවීමෙන් පසු නැවත එකතු කර බලන ලෙස ද ඉල්ලා සිටින අතර <u>එම ආකෘතිපත් පිටු කිහිපයකින් සමන්විත වන්නේ නම් සෑම පිටුවකම අගට උප එකතුව හා සියළුම පිටුවල උප එකතුන් අවසාන පිටුවේ අගට මුළු එකතුව ලෙස යෙදිය යුතුය.</u> එසේම ආදර්ශ ආකෘතියේ පරිදි <u>නිලධාරීන් සංඛ්‍යාව ගණනය කර ගැනීම සඳහා නිලධාරීන්ගේ නම් ඉදිරියෙන් අනු අංකය</u> සඳහන් කළ යුතුය. ගෙවීම් ප්‍රතිපූර්ණය කිරීමෙන් පසු හෙළිදරව් වන සටහන් කිරීමේ හා යතුරුලිවීමේ දෝෂ සම්බන්ධයෙන් මවෙත දැන්වීම අවශ්‍ය නො වන අතර අඩුවී ඇති මුදල් ප්‍රමාණ ඉහත සඳහන් ගෙවීම් කාර්ය මණ්ඩලයට ගෙවන දීමනාවෙන් හිලව් කර ගත යුතුය.

14. වෙනත් කරුණු

14.1. මෙම චක්‍රලේඛයෙහි සඳහන් උපදෙස් පරිදි මැතිවරණ රාජකාරීවල නිරත වූ කාර්ය මණ්ඩලයට හිමි දීමනා ලබාගැනීම සඳහා වවුචර් සකස් කර කඩිනමින් ඉදිරිපත් කරන ලෙස ඔබගේ නිලධාරීන් හා සේවක මහතුන් දැනුවත් කිරීමට කටයුතු කළයුතුය.

14.2. ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය/ නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් විසින් කරනු ලබන ගෙවීම් ඡන්ද විමසීම අවසන් වී දින 75 ක් තුළ හෝ ඊට පෙර ගෙවා අවසන් කරනු ලබන හෙයින් නියම කර ඇති කාලසීමාව තුළ ගෙවීම් වවුචර් ඉදිරිපත් නො කළහොත් ඔවුනට අදාළ දීමනා ලබාගත නො හැකි වනු ඇත.

14.3. ප්‍රතිපූර්ණය කිරීම පිණිස කෙරෙන ඉල්ලීම් කඩිනමින් මා වෙත ඉදිරිපත් කළ යුතු අතර එම ඉල්ලීම් අදාළ දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීට හෝ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය/ නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්ට නො යැවිය යුතුය.

14.4. මුදල් ප්‍රතිපූර්ණය සඳහා ඉදිරිපත් කරන උපලේඛන ලද වහාම ඒ බව දැනුම් දීමට ක්‍රියාකරනු ලැබේ. ඊට පිළිතුරක් නො ලදහොත් එම ලිපි අස්ථාන ගතවීමක් ලෙස සැලකිය යුතු අතර, ඒ පිළිබඳව ලියාපදිංචි තැපෑලෙන් මා වෙත වාර්තා කළ යුතුය.

14.5. ඉන්ධන වියදම් ප්‍රතිපූර්ණය කිරීම සඳහා ඔබ විසින් ඉදිරිපත් කරනු ලබන උපලේඛන (AV-1 සහ PV-1 ආකෘති) පරීක්ෂා කිරීමේ කටයුතු මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රවාහන අංශයෙන් සිදුකෙරේ. එහෙයින් එම ප්‍රතිපූර්ණය කිරීම් පිළිබඳව කරනු ලබන සියළුම විමසීම් සඳහා ප්‍රවාහන අංශය භාර මාණ්ඩලික නිලධරයා (සහකාර මැතිවරණ කොමසාරිස් (පාලන) ) අමතා අවශ්‍ය තොරතුරු ලබා ගත හැකිය.

14.6. මෙම ඡන්ද විමසීම සඳහා අදාල ගෙවීම් 2015.10.31 වන දින හෝ ඊට පෙර අවසන් කිරීමට නියම කර ඇති හෙයින්, එදිනට පසුව ඉදිරිපත් කරන ඉල්ලීම් මෙන්ම විමසීම් ද ප්‍රතික්ෂේප කිරීමට සිදුවන බව කරුණාවෙන් සලකන්න.

14.7. ඉහත කී දිනට පෙර උපලේඛන ඉදිරිපත් කර ප්‍රතිපූර්ණය කර නො ගන්නා ගෙවීම් පිළිබඳව සම්පූර්ණ වගකීම ගෙවීම් කළ නිලධරයා වෙත පැවරෙන බවත්, නියමිත දිනට ප්‍රතිපූර්ණය කර නො ගන්නා ගෙවීම් සම්බන්ධයෙන් මෙම දෙපාර්තමේන්තුව වගකීම භාර නො ගන්නා බවත් කාරුණිකව දන්වමි.

14.8. 2015.08.17 දින පැවැති පාර්ලිමේන්තු මැතිවරණයට අදාලව නිකුත් කර ඇති මෙම කාර්ය මණ්ඩල ගෙවීම් චක්‍රලේඛය හා ආකෘති පත්‍ර මැතිවරණ දෙපාර්තමේන්තුවේ www.slelections.gov.lk වෙබ් අඩවියට පිවිස ලබා ගත හැකි බව කාරුණිකව සලකන්න.

මහින්ද දේශප්‍රිය
මැතිවරණ කොමසාරිස්.

පිටපත් :- 1. විගණකාධිපති - දැන ගැනීම පිණිස
2. ප්‍රධාන කාර්යාලයේ සියළුම මාණ්ඩලික නිලධාරීන්
3. ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය/ නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්වරුන්
(2 සහ 3) දැන ගැනීම පිණිස හා මෙම චක්‍රලේඛයේ උපදෙස් අනුව ගෙවීම් කිරීම පිණිස

D:\Layani\2015\Circular Parliment Election- 2015\Circular - Revised.doc

"ඒ ආකෘතිය"

මගේ අංකය:-
ඔබේ අංකය:- එෆ්ඊ/211/2015
දිනය :-

මැතිවරණ කොමසාරිස්,

## පාර්ලිමේන්තු මැතිවරණය - 2015.08.17
### <u>මැතිවරණ රාජකාරී සඳහා සේවයේ යොදවන ලද නිලධාරින්ගේ ගෙවීම් ප්‍රතිපූර්ණය කිරීම</u>

2015.08.17 දින පැවති පාර්ලිමේන්තු මැතිවරණයේ රාජකාරී කටයුතු වල යෙදුණු මෙම ආයතනයේ නිලධාරීන්ට ඔබේ සමාංක හා 2015.08.21 දිනැති 2015/02 දරණ ගෙවීම් චක්‍රලේඛය අනුව රු. ........................................................................................................ කුත් ශත ..................... ක මුදලක් ගෙවා ඇත. එම එක් එක් නිලධරයාට කරන ලද ගෙවීම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

2. මෙම මුදල ප්‍රතිපූර්ණය කරනු පිණිස ........................................................................................................................................................................... නමින් චෙක්පතක් එවන්න.

(ඉංග්‍රීසි භාෂාවෙන් ලිවිය යුතුය)

ආයතනයේ නම :-
ආයතනයේ ලිපිනය :-
දුරකථන අංකය :-

.................................................
(ආයතන ප්‍රධානියා)

පදවි නාමය : ...........................

| අනු අංකය | (01) නිලධරයාගේ නම | (02) ස්ථිර තනතුර | (03) ඡන්ද විමසීමේ යෙදුණු දිස්ත්‍රික්කය | (04) රාජකාරී කටයුතු කළ තනතුර ප්‍ර.ග.නි./ ස.තේ.නි./ ජෙ.ඡ.ස්ථා./අ.ජේ .ඡ.ස්ථා./ ක.ඡ.ස්ථා./ වි.ක.ඡ.ස්ථා/ ලිපිකරු/ කා.කා.ස. | (05) ගමන් වියදම් හා සංයුක්ත දීමනාව (සම්පූර්ණ කාර්යය සඳහා) | සංයුක්ත දීමනාව ගෙවූ දින ගණන | දීමනා | | | (09) |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | (06) ඡන්ද පොළ කටයුතු | (07) ගණන් කිරීම | (08) නිකුත් කිරීම හා භාර ගැනීම | නිලධරයා කැටුව යන රජයේ සේවයේ නොවන කා.කා.ස./ රියදුරු දීමනාව |
| 1. | | | | | | | | | | |
| 2. | | | | | | | | | | |
| 3. | | | | | | | | | | |
| 4. | | | | | | | | | | |
| 5. | | | | | | | | | | |
| | මුළු ගණන | | | | | | | | | |

සකස් කළේ :-
අත්සන :
නම :
තනතුර :

පරීක්ෂා කළේ :-
අත්සන :
නම :
තනතුර :

මෙම ඉල්ලීම හා වවුචර් තම ස්ථිර සේවා ස්ථානය පිහිටි දිස්ත්‍රික්කයේ මැතිවරණ කාර්යාලයට යැවිය යුතුය.

**"සී" ආකෘතිය**

...................................................................

...................................................................

(පාසලේ නම හා ලිපිනය)

............................................. දින

ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය/ නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්,

............................................... දිස්ත්‍රික් ලේකම් කාර්යාලය.

**පාර්ලිමේන්තු මැතිවරණය - 2015.08.17**

**මැතිවරණ රාජකාරී දීමනා ලබාගැනීම ( පාසල්වල විදුහල්පතිවරුන්ගේ හා ගුරුභවතුන්ගේ මැතිවරණ රාජකාරී ගෙවීම්)**

2015.08.17 දින පැවැති පාර්ලිමේන්තු මැතිවරණයේ රාජකාරී කටයුතුවල යෙදුණු මෙම විදුහලේ විදුහල්පතිවරුන්ට හා ගුරුභවතුන්ට ඔබේ සමාංක හා 2015.08.21 දිනැති 2015/02 දරණ ගෙවීම් චක්‍රලේඛය අනුව ගෙවීම් කිරීම සඳහා ඔවුන්ගේ මුල් (Original) වවුචර් ............. ක් මේ සමඟ එවා ඇත. එක් එක් විදුහල්පතිවරුන්ගේ හා ගුරුභවතුන්ගේ මූලික වැටුප නිවැරදිව සඳහන් කර ඇති බව මෙයින් සහතික වෙමි.

මෙම පාසලෙන් මැතිවරණ රාජකාරීවලට සහභාගී වූ පහත නම් සඳහන් විදුහල්පතිවරුන්ගේ/ ගුරුභවතුන්ගේ වවුචර් පත්වල විස්තර පහත පරිදි වේ.

| අංකය | විදුහල්පතිවරයාගේ/ ගුරුවරයාගේ නම | පොදු 35 මඟින් ඉල්ලා සිටින මුදල රු. | පොදු 177 මඟින් ඉල්ලා සිටින මුදල රු. | එකතුව රු. |
|---|---|---|---|---|
| 01 | | | | |
| 02 | | | | |
| 03 | | | | |
| 04 | | | | |
| 05 | | | | |
| | එකතුව | | | |

මෙම පාසලේ සංවර්ධන සමිති ගිණුම් අංකය :- ..................................................

බැංකුව ......................................., ශාඛාව :- ..................................................

.....................................................

(විදුහල්පතිගේ අත්සන හා නිල මුද්‍රාව)

"බී ආකෘතිය"

මගේ අංකය:-
ඔබේ අංකය:- එෆ්ඊ/211/2015
දිනය :-

මැතිවරණ කොමසාරිස්,

## පාර්ලිමේන්තු මැතිවරණය - 2015.08.17

## මැතිවරණ රාජකාරී සඳහා සේවයේ යොදවන ලද රජයේ සේවයේ නියුතු රියදුරන්ගේ ගෙවීම් ප්‍රතිපූර්ණය කිරීම

2015.08.17 දින පැවති පාර්ලිමේන්තු මැතිවරණයේ රාජකාරී කටයුතුවල යෙදුණු මෙම ආයතනයේ රියදුරන්ට ඔබේ සමාංක හා 2015.08.21 දිනැති 2015/02 දරණ ගෙවීම් චක්‍රලේඛය අනුව රු. ........................................................................................................ කුත් ශත ..................... ක මුදලක් ගෙවා ඇත. එම එක් එක් රියදුරුට කරන ලද ගෙවීම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

2. මෙම මුදල ප්‍රතිපූර්ණය කරනු පිණිස ........................................................................................................ නමින් චෙක්පතක් එවන්න.
(ඉංග්‍රීසි භාෂාවෙන් ලිවිය යුතුය)

ආයතනයේ නම :-
ආයතනයේ ලිපිනය :-
දුරකථන අංකය :-

.................................................
(ආයතන ප්‍රධානියා)

පදවි නාමය : ...........................

| අනු අංකය | (01) රියදුරුගේ නම | (02) වාහනයේ අංකය | (03) වාහනය වෙන්කළ/ සංචිතයේද යන වග | (04) නිලධරයකුට වෙන්කළ වාහනයක් නම් එම නිලධරයාගේ නම | (05) ඡන්ද විමසීමේ යෙදුණු දිස්ත්‍රික්කය | [illegible] | (06) ගමන් වියදම් හා සංයුක්ත දීමනාව (සම්පූර්ණ කාර්යය සඳහා) රු. ශත | (07) අතිකාල හා නිවාඩු දින වැටුප් රු. ශත |
|---|---|---|---|---|---|---|---|---|
| 1. | | | | | | | | |
| 2. | | | | | | | | |
| 3. | | | | | | | | |
| 4. | | | | | | | | |
| 5. | | | | | | | | |
| 6. | | | | | | | | |
| එකතුව | | | | | | | | |

සකස් කළේ :-
අත්සන :
නම :
තනතුර :

පරීක්ෂා කළේ :-
අත්සන :
නම :
තනතුර :

චක්‍රලේඛ අංක 2015/02(I)

මගේ අංකය:- එෆ්ජ්/211/2015
මැතිවරණ මහලේකම් කාර්යාලය
සරණ මාවත,
රාජගිරිය.

2015.08.24

සියළුම අමාත්‍යාංශ ලේකම්වරු, පලාත් සභා ප්‍රධාන ලේකම්වරු හා ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් හා සෙසු ව්‍යවස්ථාපිත කොමිෂන් සභා ලේකම්වරු,
සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා පලාත් සභා අමාත්‍යාංශ ලේකම්වරු,
පලාත් ආණ්ඩුකාරවර ලේකම්වරු හා පලාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්වරු,
සියළුම සංස්ථා හා ව්‍යාවස්ථාපිත මණ්ඩලවල සභාපතිවරු/ සාමාන්‍යාධිකාරීවරු,

පාර්ලිමේන්තු මැතිවරණය - 2015.08.17
**මැතිවරණ කාර්ය මණ්ඩලයට ගෙවීම්**

ඉහත කරුණට අදාලව නිකුත් කරන ලද 2015.08.21 දිනැති අංක 2015/02 දරණ මැතිවරණ කාර්ය මණ්ඩලයට ගෙවීම් මැයෙන් යුත් චක්‍රලේඛයට ඔබගේ කාරුණික අවධානය යොමු කරවමි.

02. දිස්ත්‍රික් තේරීම්භාර නිලධරයකු විසින් ලිඛිත පත්වීමක් කරනු ලැබ ඡන්ද ප්‍රදේශ/ ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් පිහිටුවනු ලැබූ ප්‍රාදේශීය සම්බන්ධීකරණ කාර්යාලයක සේවය කළ ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයකු, අතිරේක ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයකු, කණිෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයකු, විශේෂ කණිෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයකු, ලිපිකරුවකු හෝ කාර්යාල කාර්ය සහායකයකු CE - 52 දරණ පැමිණීමේ සහතිකයකින් ඒ බව සනාථ කරන්නේ නම් එවැනි තැනැත්තෙකුට 7.1 අනුඡේදය යටතේ දක්වා ඇති වගුවේ සඳහන් එක් දීමනාවක් තම ස්ථිර සේවා ස්ථානයෙන් ගෙවිය හැකිය.

03. මෙම ගෙවීම් සඳහා වූ වියදම "ඒ" ආකෘතිය මගින් මැතිවරණ මහලේකම් කාර්යාලයට ඉදිරිපත් කර ප්‍රතිපූර්ණය කරවා ගත හැකි බව කාරුණිකව දන්වා සිටිමි.

මහින්ද දේශප්‍රිය
මැතිවරණ කොමසාරිස්.

පිටපත් :-
1. විගණකාධිපති - දැන ගැනීම පිණිස
2. ප්‍රධාන කාර්යාලයේ සියළුම මාණ්ඩලික නිලධාරීන්
3. ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය/ නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්වරුන්
} දැන ගැනීම පිණිස හා මෙම චක්‍රලේඛයේ උපදෙස් අනුව ගෙවීම් කිරීම පිණිස

D:\Layani\2015\Ac.01.w.2015. 22 Aug 01.docx

චක්‍රලේඛ අංක 2015/02(II)

මගේ අංකය:- එල්ජ්/211/2015
මැතිවරණ මහලේකම් කාර්යාලය
සරණ මාවත,
රාජගිරිය.

2015.08.25

ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය
ප්‍රධාන ලේකම්වරු, - සියළුම පළාත් සහා
පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්වරු,
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරු,

| |
|---|
| ඉතා හදිසියි<br>URGENT |

පාර්ලිමේන්තු මැතිවරණය - 2015.08.17
මැතිවරණ කාර්ය මණ්ඩලයට ගෙවීම් පිළිබඳ චක්‍රලේඛය සම්බන්ධයෙනි

| |
|---|
| පාර්ලිමේන්තු මැතිවරණයේ රාජකාරීවල නිරත වූ විදුහල්පතිවරුන්ගේ හා ගුරුවරුන්ගේ දීමනා ගෙවීම 2015 ට පෙර සිදු කළ පරිදි කලාප අධ්‍යාපන කාර්යාල හරහා සිදු කරනු ලැබේ. |

2015.08.21 දිනැති අංක 2015/02 දරණ මැතිවරණ කාර්ය මණ්ඩලයට ගෙවීම් මැයෙන් යුත් චක්‍රලේඛය අනුව විදුහල්පතිවරුන්ට/ ගුරුවරුන්ට මැතිවරණ රාජකාරි සඳහා දීමනා දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල හරහා ගෙවීමට පියවර ගන්නා බව සඳහන් කර තිබූ නමුත් පසුගිය ජනාධිපතිවරණයට අදාළ ගෙවීම් මැතිවරණ කාර්යාල හරහා සිදු කිරීමේ දී අනවශ්‍ය ප්‍රමාද සිදු කළ බවට ලද පැමිණිලි හේතුවෙන් පෙර සඳහන් චක්‍රලේඛයේ 03 (ආ) VII වගන්තිය හා 11 වගන්තිය මතු සඳහන් පරිදි සංශෝධනය කරන ලද බව කාරුණිකව දන්වමි.

02. පාසල්වල විදුහල්පතිවරුන්ගේ හා ගුරුවරුන්ගේ මැතිවරණ රාජකාරි සඳහා වූ දීමනා ලබා ගැනීමට ඔවුන්ගේ ගෙවීම් වවුචර්වල මුල් පිටපත් තම පාසල පිහිටි දිස්ත්‍රික්කයේ කලාප අධ්‍යාපන කාර්යාලය වෙත ඉදිරිපත් කළ යුතුය. එම වවුචර් සඳහා අදාළ කලාප අධ්‍යාපන කාර්යාලයෙන් ගෙවීම් කළපසු මැතිවරණ කාර්ය මණ්ඩලයට ගෙවීම් විස්තර "ඒ" ආකෘතිය අනුව සම්පූර්ණ කරන ලද උපලේඛනයක් මඟින් මැතිවරණ මහලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කර අදාළ මුදල ප්‍රතිපූර්ණය කර ගැනීමට හැකිය. යම් පාසලක රියදුරකු මැතිවරණ රාජකාරියෙහි නිරත වුයේ නම් ඔහුට හිමි දීමනා කලාප අධ්‍යාපන කාර්යාලයෙන් ගෙවා අදාළ ගෙවීම් විස්තර "බී" ආකෘතිය අනුව සම්පූර්ණ කරන ලද උපලේඛනයක් මඟින් මැතිවරණ මහලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කර එම මුදල ප්‍රතිපූර්ණය කර ගැනීමට හැකිය.

03. විදුහල්පතිවරුන්ට හා ගුරුවරුන්ට ගෙවීම් කිරීම සඳහා ප්‍රමාණවත් තරම් අත්මුදල් කලාප අධ්‍යාපන කාර්යාලවල නොමැති නම් කලාප අධ්‍යාපන කාර්යාලයට අයත් සම්පූර්ණ වවුචර් ප්‍රමාණය පාසල්වලින් ලැබෙන තෙක් නොසිට උපලේඛනය කොටස් වශයෙන් මැතිවරණ මහලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කර එම මුදල ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කිරීම යෙහෙකි. විදුහල්පතිවරුන්ගේ හා ගුරුවරුන්ගේ දීමනා ගෙවීම් සම්බන්ධයෙන් ප්‍රමුඛතාව ලබා දීමට පියවර ගෙන ඇති බව කාරුණිකව දන්වා සිටිමි.

04. එමෙන්ම ගෙවීම් කටයුතුවල නිරතවන කලාප අධ්‍යාපන කාර්යාලවල නිලධාරීන්ට ඒ වෙනුවෙන් වූ දිරිදීමනාව ද සුපුරුදු පරිදි ගෙවනු ලැබෙනු ඇත.

මහින්ද දේශප්‍රිය
මැතිවරණ කොමසාරිස්.

පිටපත් :- 1. තේරීම්භාර නිලධාරීන්/ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල ප්‍රධානීන් - දැන ගැනීම පිණිස හා අවශ්‍ය කටයුතු සඳහා
2. කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්/ කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් - දැන ගැනීම පිණිස හා නිසි කටයුතු සඳහා
3. සියළුම විදුහල්පතිවරුන් - දැන ගැනීම පිණිස හා ස්වකීය අධ්‍යයන කාර්ය මණ්ඩලය දැනුවත් කිරීම පිණිස

D:\Layani\2015\Ac.01.w.2015. 25 Aug 01.docx